# අකිර කුරොසවගේ ඉකිරු චිත්‍රපටය

*සුජානි සෝමසිරි*
*සහකාර කථිකාචාර්ණී,*
*සිංහල අධ්‍යයන අංශය,*
*කැලණිය විශ්වවිද්‍යාලය.*

අකිර කුරොසව, ජපානයේ පහළ වූ විශිෂ්ටතම සිනමා අධ්‍යක්ෂවරයෙකි. වර්ෂ 1952 දී ඔහු නිර්මාණය කළ ඉකිරු චිත්‍රපටය, ලෝක සිනමාවේ ශ්‍රේෂ්ඨ ම කෘතියක් ලෙස සැලකේ. එය මනුෂ්‍යත්වය පිළිබඳ අනුවේදනීය විවරණයකි. ඉකිරු, ජීවිතය හා බැඳුණු සත්‍යයක් පිළිබඳ යථාර්ථයක් හෙළි කරන්නකි.

මේ චිත්‍රපටයේ ප්‍රධාන තේමාව වන්නේ මනුෂ්‍ය ජීවිතයේ පරමාර්ථය කුමක්දැ යි විමසා බැලීමය. ඉකිරුහි සිංහල අර්ථය නම් "ජීවත් වෙමි" යන්නය. (To Live) චිත්‍රපටයේ කතා පුවත ප්‍රාරම්භයෙන් නම් සිතේ පිළිසිඳ ගත්තේ කෙසේදැ යි කුරොසව විස්තර කර තිබේ.

> "ඇතැම් අවස්ථාවල දී මට මරණය ගැන කල්පනා වේ. ඉතා කෙටි කාලයක් පමණක් ජීවත් වී, ඉටු කිරීමට විශාල වැඩ කොටසක් තවමත් ඉතිරිව තිබිය දී අවසන් හුස්ම හෙළිය හැක්කේ කෙසේද යි සිතෙන විට මා තුළ නොසන්සුන් බවක් හට ගනියි... ඉකිරු සිහි වූයේ එබඳු සිතුවිලි තුළිනි."

ඉකිරු චිත්‍රපටය ඇරඹෙන්නේ X - Ray රූපයක දර්ශනයකිනි. එය කතා නායකයා වූ වතනබෙගේ උදර පිළිකාව හා සම්බන්ධ වූවකි. ඔහු තමාට පිළිකාවක් වැළඳී ඇතැයි නොදනී. වතනබෙ වනාහි තිස් වසරක පමණ කාලයක් නගර සභා කාර්යාලයක